විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් රාජ්‍ය සේවයක්

# පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත
# மாகாண அரசாங்க சேவை ஆணைக்குழு - மேல் மாகாணம்
# PROVINCIAL PUBLIC SERVICE COMMISSION - WESTERN PROVINCE

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරිය இல.628, 10 வதுமாடி, ஜனஜயசிட்டிவளாகம், நாவலவீதி, ராஜகிரியNo.628,10th Floor,Jana Jaya City Building,Nawala Road,Rajagiriya

| මගේ අංකය / எனது இல. / My Ref. | WPC/PSC/REC/04/1 (i) | ඔබේ අංකය / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2024.07.25 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාත.

**<u>අයදුම්පත් කැඳවීමේ දින දීර්ඝ කිරීම.</u>**

පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමේ තරග විභාග සඳහා අයදුම්පත් කැඳවීමේ දින දීර්ඝ කිරීමට තීරණය කර ඇත. ඒ අනුව අයදුම්පත් කැඳවීමේ අවසන් වන දිනය 2024.08.15 වේ. මේ වන විටත් ඉහත තනතුර සඳහා අයදුම්කිරීමට නොහැකි වූ අයදුම්කරුවන්හට 2024.08.15 දින දක්වා අයදුම් කිරීමට හැකියාව පවතී. එසේම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් සලකා බැලීමේ අවසන් දිනය නොවෙනස්ව පවතී.

02. අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ පළ කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

i) **බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය, පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණුව සඳහා) සහ පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා) සඳහා වන සීමිත බඳවා ගැනීම – 2024**

ii) **බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණ සේවා ගණයේ ජනපද නිලධාරී තනතුර III ශ්‍රේණිය සඳහා වන සීමිත බඳවා ගැනීම – 2024**

03. මේ සම්බන්ධයෙන් ඔබගේ කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන් සහ ඔබ යටතේ කාර්යාලවල සේවයේ නියුතු නිලධාරීන් කඩිනමින් දැනුවත් කිරීමට කටයුතු කරන්නේ නම් මැනවි.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

දු.ක. - 011 2879614
ෆැක්ස් - 011 2879512
ඊ-මේල් - ppscwprec@sltnet.lk

පිටපත්:-

01. ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප.) - අ.ක.ස.
02. ලේකම්, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප.) - අ.ක.ස.
03. ලේකම්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප.) - අ.ක.ස.
04. ලේකම්, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය (බ.ප.) - අ.ක.ස.
05. ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය (බ.ප.) - අ.ක.ස.


| ලේකම් / செயலாளர் / Secretary | සහකාර ලේකම් (කළමනාකරණ හා ප්‍රතිපත්ති) / உதவிச் செயலாளர் (முகாமை மற்றும் கொள்கைகள்) / Assistant Secretary (Management & Policies) | සහකාර ලේකම් (විභාග හා බඳවාගැනීම්) / உதவிச் செயலாளர் (பரீட்சைகள் மற்றும் ஆட்சேர்ப்பு) / Assistant Secretary (Examinations & Recruitment) | සහකාර ලේකම් (ආයතන හා ගිණුම්) / உதவிச் செயலாளர் (தாபனம் மற்றும் கணக்கு) / Assistant Secretary (Establishment & Accounts) | පරිපාලන නිලධාරී / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer | කාර්යාලය / அலுவலகம் / Office: 011 2879614<br>ෆැක්ස් / பெக்ஸ் / Fax: 011 2879512<br>ඊ-මේල් / மின்னஞ்சல் / E-Mail: ppscwpse@sltnet.lk |
|---|---|---|---|---|---|
| 011 2879528 | 011 2879610 | 011 2879317 | 011 2879538 | 011 2879517 | |

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්)
III ශ්‍රේණිය, පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණුව සඳහා) සහ පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා)
සඳහා වන සීමිත බඳවා ගැනීම – 2024

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පහත තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහා බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

I. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය
II. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්)
(එක් වසරක පුහුණු කාලය)
III. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්)
(දෙවසරක පුහුණු කාලය)

**1.** පොදු සුදුසුකම්

1.1 පත්වීම ස්ථිර කර තිබිය යුතුය.
1.2 නියමිත දිනට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දෙපාර්තමේන්තුගත ස්ථිර තනතුරක යටත් පිරිසෙයින් වසර (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබීම.
1.3 බස්නාහිර පළාත් පාලන චක්‍රලේඛ 04/2021 හි සඳහන් විධි විධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
1.4 සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධාරියා සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.
1.5 අයදුම්කරු බස්නාහිර පළාත තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**2.** බඳවා ගැනීමේ ක්‍රමය

ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

**2.1 තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය, තාක්ෂණ නිලධාරී සිවිල් (එක් වසරක පුහුණු කාලය) සහ පුහුණු ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) සඳහා බඳවා ගැනීමේ ලිඛිත විභාගය**

| විෂයයන් | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| තාක්ෂණික හැකියාව | පැය 03 | 100 | 40% |

**2.2 විභාගය සඳහා වන විෂය නිර්දේශය**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය. |
| තාක්ෂණික හැකියාව | ගොඩනැගිලි, මාර්ග හා වාරිමාර්ග ඉදිකිරීමේ මූලධර්ම, ඉදිකිරීම් කාර්ය සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනීමේ හැකියාව, ඇස්තමේන්තු පිළියෙල කිරීමේ හැකියාව, ජල සැපයීම, ජල ප්‍රවාහන ක්‍රියාමාර්ග හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙල පිළිබඳව අපේක්ෂකයා සතු අත්පත් කර ගත යුතු හැකියාවන් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත වේ. |

**3.** වැටුප

(i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි MN 03 – 2016 අනුව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ තාක්‍ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණියට හිමි මාසික වැටුප් පරිමාණය රු.31,040-10x445-11x660-10x730-10x750-57550/- වේ.

(ii) සටහන
බඳවා ගැනීම්, උසස් කිරීම් වලදී නිකුත් කරනු ලබන පත්වීම් ලිපිවල වැටුප් පරිමාණ සඳහන් කිරීමේදී අංක 03/2016 චක්‍රලේඛයේ උපලේඛණ I සඳහන් නියමිත වැටුප් පරිමාණය සඳහන් කල යුතුය. එහෙත් ගෙවීම් කල යුත්තේ, උපලේඛණ II හි සඳහන් පරිදි බැව් පත්වීම් ලිපියෙහි සඳහන් කල යුතුය.

(iii) බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ තාක්‍ෂණ නිලධාරී (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිවලට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛණ V හි සඳහන් පරිදි ගෙවීම් කරනු ලැබේ.

**4. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ තාක්‍ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය (සෘජු බඳවා ගැනීම)**

**(අ) අධ්‍යාපන සුදුසුකම්**

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව ගණිතය යන විෂයයනට සම්මාන සාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත්වීම.

**(ආ) වෘත්තීය සුදුසුකම්**

I. මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පරිනමනු ලබන ජාතික තාක්‍ෂණික (සිවිල්) ඩිප්ලෝමාව.

හෝ

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (සිවිල්)

හෝ

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්)

හෝ

IV. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පරිනමනු ලබන තාක්‍ෂණික ඩිප්ලෝමාව (සිවිල්)

හෝ

V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම.

හෝ

VI. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්‍ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්‍ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්‍ෂණික සුදුසුකම් ලබා තිබීම.

**(ඇ) පළපුරුද්ද**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ප්‍රාථමික හෝ ඉන් ඉහල සේවා ගණයක ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

5. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ තාක්‍ෂණ නිලධාරි (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණුව සඳහා)

(අ) අධ්‍යාපන සුදුසුකම්

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත්වීම.

(ආ) වෘත්තීය සුදුසුකම්

(i) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සිවිල් ක්ෂේත්‍රයේ වසර 03 ක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය (සිවිල්) ලබා තිබීම.

හෝ

(ii) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සිවිල් ක්ෂේත්‍රයේ කර්මාන්ත තාක්‍ෂණිකයන් සඳහා වූ වසර 02 ක ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාල සහතිකය ලබා තිබීම.

හෝ

(iii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්‍ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්‍ෂණික සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්‍ෂණික සුදුසුකම් ලබා තිබීම.

සමඟ

(iv) අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක පළපුරුද්ද

(ඇ) පළපුරුද්ද

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ප්‍රාථමික හෝ ඉන් ඉහල සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

6. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ තාක්‍ෂණ නිලධාරි (සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා)

(අ) අධ්‍යාපන සුදුසුකම්

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හය (06) කින් සමත්වීම.

(ආ) පළපුරුද්ද

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තු ගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක සක්‍රීය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

7. අයදුම් කිරීමේ ක්‍රමය

7.1 සෑම අපේක්‍ෂකයෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුවේ. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු.1200/= කි. මෙම විභාග ගාස්තුව බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම බස්නාහිර පළාත තුල පිහිටා ඇති ඕනෑම ප්‍රදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබාගන්නා බ.ප.1 ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තවද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

7.2 අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට 2024.06.30 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, බස්නාහිර පළාත. අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණියට/( සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණියට (වසරක)/( සිවිල්) පුහුණු කිරීමේ ශ්‍රේණියට (දෙවසරක) තනතුරට බඳවා ගැනීමේ විභාගය 2024 (සීමිත) යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පත්‍රයක් භාරගනු නොලැබේ.

7.3 අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිත කරමින් A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 04 තෙක් පළමු පිටපතටද අංක 05 සිට ඉදියට අනෙක් පිටපත්වලටද ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති, අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර, නිවේදනයේ සඳහන් පරිදි මූලික සුදුසුකම් නොමැති බව අයදුම්පත්‍රයේ තොරතුරු අනුව පෙනී යන්නේ නම් ද කිසිම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

7.4 අයදුම්පත්‍ර පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කළ යුතුය.

7.5 නිවේදනයේ සඳහන් සුදුසුකම් සහිත බව දක්වමින්, මෙම නිවේදනයට අනුකූලව සකසා ඇති හා නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරඟ විභාගයට පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේදී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාල සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

7.6 අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 07 ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක්ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සියද, ඇතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය.

7.7 අයදුම්පත්‍රයේ හා විභාග ප්‍රවේශපත්‍රයේ අත්සන් සහතික කිරීමට බලය ලත් අයෙකු විසින් අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතුය. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අත්සන අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු ලවාද, අනෙකුත් අයදුම්කරුවන් අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු දිවුරුම් කොමසාරිස් වරයකු, නීතිඥයෙකු ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, තිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සෙවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු රු. රු.498,960/- වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජා ස්ථානයක් භාර හෝ පූජා පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන පූජක කෙනෙකු යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලබා සහතික කරවා ගත යුතුය.

**8.** විභාගයට ඇතුල්වීම

8.1 නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේදීම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභායට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

8.2 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුනට සිදු වනු ඇත.

8.3 අපේක්ෂකයාගේ අනන්‍යතාවය, තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයන් විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
ii. ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු රියදුරු බලපත්‍රය

**9. සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම**

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ඇය ගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

**10. විභාග ක්‍රමය**

i. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ.
ii. අපේක්ෂකයෙකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතුය.
iii. අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති භාෂා මාධ්‍ය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**11.** මෙම විභාගයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුලත් ප්‍රතිඵල, ලේඛණය, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම, තැපැල මගින් හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවිය මගින් පළකිරීම හෝ සිදු කරනු ඇත.

**12.** මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් අනාවරණය වන/නොවන අදාළ කරුණු පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**13.** මෙම ගැසට් නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි අනුවාද අතර යම් අනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

**14.** මෙම දැන්වීම හා ආදර්ශ අයදුම්පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේද පළ කර ඇත.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත
2024.05.30

O/c
තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

ආදර්ශ අයදුම්පත්‍රය

## බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තාක්ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය, පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණු කාලය) සහ, පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණු කාලය) සඳහා බඳවා ගැනීම - 2024 (සීමිත)

විභාග අංකය [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

නිවේදනයේ අංක 1 අනුව ඉල්ලුම්කරන තනතුරට අදාළ ශ්‍රේණිය ..........

(මෙම ශ්‍රේණිය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

සිංහල - S
දෙමළ - T
ඉංග්‍රීසි - E

[ ] (අදාළ මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ)

**1**

1.1 සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -..........
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමග අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):
..........
(උදා: H.M.S.K. GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්)-..........

1.4 ජාතික හැඳුනුම්පත් අංකය [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

**2**

2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්): ..........
..........

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්): ..........
..........

2.3 ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය: (අදාළ කොටුව තුළ √ ලකුණ යොදන්න )

කොළඹ [ ] ගම්පහ [ ] කළුතර [ ]

2.4 දුරකථන අංකය :

කාර්යාලය: [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ] ජංගම: [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

❖ බඳවා ගැනීම් සම්බන්ධ සියළු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට SMS ක්‍රමය මගින් යවනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න.

3

3.1 උපන් දිනය - වර්ෂ [ ] මාසය [ ] දිනය [ ]

3.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2024.06.30 දිනට වයස,

අවුරුදු [ ] මාස [ ] දින [ ]

**4.**

4.1 ස්ත්‍රී/පුරුෂ භාවය - (අදාළ කොටුව තුළ √ ලකුණ යොදන්න )
ස්ත්‍රී - [ ] පුරුෂ - [ ]

4.2 විවාහක/අවිවාහක බව - (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න)

විවාහක [ ] අවිවාහක [ ]

5. 5.1 බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දැනට දරන තනතුර:- ..........................................................................................

5.2 එම තනතුරේ සේවය ස්ථිර කරන ලද දිනය (ස්ථිර කිරීමේ ලිපියේ සහතික කරන ලද පිටපතක් ඇමිණිය යුතුය):- ..........................................................

5.3 අයදුම්පත් කැඳවන දිනට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දෙපාර්තමේන්තුගත ස්ථිර තනතුරක යටත් පිරිසෙයින් වසර (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? .............. (දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඒ බව සනාථ කරන ලද සහතිකය ඇමිණිය යුතුය)

5.4 බස්නාහිර පළාත් පාලන චක්‍රලේඛ 04/2021 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා ඇති/ නැති බව :- .........

6. පළපුරුද්ද (තනතුරට අදාළව අදාළ ක්ෂේත්‍රයේ වසර 05/10 ක පළපුරුද්ද) ...... (සනාථ කිරීමට සේවා සහතිකය ඇමිණිය යුතුය.)

7. අධ්‍යාපන සුදුසුකම් - (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 04,05 හා 06 අනුව ඉල්ලුම් කරන තනතුරට අදාල සුදුසුකම් දැක්විය යුතු අතර ඡායා පිටපත් ඇමිණිය යුතුය.)

**7.1** **අ.පො.ස. (සා.පෙළ) සුදුසුකම්**

i. විභාගයේ වර්ෂය : ....................

ii. විභාග අංකය: ....................

ප්‍රතිඵල

| අනු අංකය | විෂය | සාමාර්ථය | අනු අංකය | විෂය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| 1 | | | 7 | | |
| 2 | | | 8 | | |
| 3 | | | 9 | | |
| 4 | | | 10 | | |
| 5 | | | | | |
| 6 | | | | | |

**7.2** **වෘත්තීය සුදුසුකම්**

අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 04,05 හා 06 අනුව ලබා ඇති වෘත්තීය සුදුසුකම් (නිවේදනයේ සඳහන් වෘත්තීය සුදුසුකම්වලට අදාල අනු අංකය ඉදිරියෙන් සටහන් කරන්න.) ..........................................................................................................

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාල සීමාව | සාමාර්ථය | සහතිකපත් අංකය හා වලංගු දිනය |
|---|---|---|---|---|
| | | | | |

**8.** විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය : දිනය -

ලදුපත් ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය -

| |
|---|
| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න |

9. <u>අයදුම්කරුගේ සහතිකය</u>

..........................................................................................................................................

.............................................................. වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්‍ෂණ සේවයේ තාක්‍ෂණ නිලධාරී (සිවිල්) III ශ්‍රේණියේ තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරව දනිමි. තවද සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

දිනය ........................ ................................................

අයදුම්කරුගේ අත්සන

10. <u>අයදුම්කරුගේ අත්සන සහතික කිරීම</u>

<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය</u>

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................................................ මයා/මිය/මෙනවිය විසින් ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවටත්, දැනට ......................................................................................... අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ..................................................................... වශයෙන් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ යෙදී සිටින බවත්, ඔහුට/ ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවටත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත් සහතික කරන අතර මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඇය/ ඔහු තෝරාගනු ලැබුවහොත් ඔහු/ ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි බවත් නිර්දේශ කරමි

................................................. ..................................................

දිනය

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

11. <u>අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය</u>

ඉහත නිර්දේශය සමඟ එකඟ වෙමි./ නොවෙමි.

................................................. ..................................................

දිනය

අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන හා නිල මුද්‍රාව